**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ
**ප්‍රවෘත්ති නිවේදනය**
මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපෑල: MannDT@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20220628

**ශ්‍රී ලංකාවේ ළමුන් 800,000කට වැඩි පිරිසකට ආහාර ලබාදීම සඳහා, අමතර ආධාර වශයෙන් ඩොලර් මිලියන 20 ලබාදෙන බව බයිඩන් ජනපතිතුමා නිවේදනය කරයි**

ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා ඩොලර් මිලියන 20 ක අතිරේක ආධාරයක් ලබාදෙන බව අද පැවති G7 සමුළුවේදී එක්සත් ජනපදයේ ජෝ බයිඩන් ජනාධිපතිතුමා විසින් නිවේදනය කරන ලදී. එක්සත් ජනපදයෙන් ලබාදෙන අරමුදල් සම්බන්ධයෙන් මෑතකාලීනව සිදුකළ අනෙකුත් නිවේදනවලට අමතරව නිවේදනය කර ඇති මෙම ආධාර මුදල්, වත්මන් ආර්ථික අර්බුදය තුළ වඩාත්ම අවශ්‍යතා ඇති ශ්‍රී ලාංකිකයන් ඉලක්ක කරනු ඇත. ඉදිරි මාස 15 තුළ ශ්‍රී ලාංකික දරුවන් 800,000 කට වැඩි පිරිසකට ආහාර ලබාදෙන පාසල් පෝෂණ වැඩසටහනකට සහාය වීම සහ 27,000 කට අධික ගර්භනී සහ කිරි දෙන මවුවරුන් සඳහා ආහාර වවුචර ලබා දීම මෙම අරමුදල්වල අරමුණයි. එසේම, වඩාත්ම අවදානමට ලක්විය හැකි ශ්‍රී ලාංකික ප්‍රජාවන්ගේ ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික ආධාර සහ මුදල් ආධාර ලබාදීම තුළින් දළ වශයෙන් ගොවීන් 30,000 කට උපකාර කිරීම සඳහා ද මෙම ප්‍රයත්නය හරහා සැලසුම් කර තිබේ.

“ශ්‍රී ලංකාවට අමතර ආධාර වශයෙන් තවත් ඩොලර් මිලියන 20ක් ලබාදෙන බව බයිඩන් ජනාධිපතිතුමා විසින් නිවේදනය කිරීම සියළුම ශ්‍රී ලාංකීය ජනතාවගේ අහාර සුරක්ෂිතතාවය, මහජන සෞඛ්‍ය සහ ආර්ථික සුබසෙත වෙනුවෙන් එක්සත් ජනපදයේ ඇති අඛණ්ඩ කැපවීම පෙන්නුම්

කරනවා,'' යනුවෙන් ශ්‍රී ලංකාවේ එ.ජ. තානාපති ජුලී චංග් මහත්මිය සඳහන් කළාය. ''ආර්ථික ස්ථායිතාවය දිරිගැන්වීමට ශ්‍රී ලංකාව දරන වෑයම් සඳහා එක්සත් ජනපදය දිගටම සහය ලබාදෙනු ඇති අතර, මේ ආධාර අවශ්‍යම කරන ප්‍රජාවන් සහ ළමයින් කරා ඒවා ළඟාවන බව සහතික කරගනු ඇති.''

අද දින නිවේදනය කළ මෙම ඩොලර් මිලියන 20 ක අතිරේක ආධාර මුදල, මෑතකාලීනව ශ්‍රී ලාංකීය ජනතාවට සහයෝගය දැක්වීම සඳහා ආර්ථික සහ මානුෂීය ආධාර වශයෙන් පොරොන්දු වූ ඩොලර් මිලියන 12 කට ආසන්න ප්‍රමාණයට අමතරව ලබාදෙන්නක් වන අතර, ඒ සමගින්, 2022 ජුනි මස 16 වැනි දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් එක්සත් ජනපදය ලබාදෙන ආධාර ප්‍රමාණය ඩොලර් මිලියන 32 දක්වා ඉහළ නංවයි. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිතායතනය (USAID) හරහා ලබාදෙනු ඇති මෙම අරමුදල්, ගෝලීය වශයෙන් පිළිගත් අධීක්ෂණ සහ ඇගැයුම් ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන හවුල්කාර සංවිධාන වෙත ප්‍රදානය කෙරෙනු ඇත. ලබාදෙන අරමුදල් සම්බන්ධයෙන් වගවන බවත්, ආහාර අනාරක්ෂිතබවින් වඩාත්ම අවදානමට ලක්වූ අය වශයෙන් හඳුනාගත් පිරිස් වෙත මෙම ආධාර ළඟා වන බවත් ඒ හරහා සහතික වේ.